# ශ්‍රී ලංකාවේ ගුරුවිද්‍යාලයීය පුහුණු (සිංහල මාධ්‍යය) පාඨමාලාවට අයත් විෂය නිර්දේශයේ වෘත්තීය අධ්‍යාපන ඛණ්ඩය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති

( M.Phil ) උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන

පර්යේෂණ නිබන්ධනය.

1987.

පී.එම්.යූ.පතිරාජ

1981/M.Phil/20.

අධ්‍යාපන පීඨය,

ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලය,

කොළඹ 03.

1987 මැයි. 01.

# සංක්ෂිප්තය.

## ගැටළුවේ වැදගත්කම.

විධිමත් අධ්‍යාපන කාර්යයේ මූලික අත්තිවාරම දැමීමේ නියමුවන් පුහුණු ගුරුවරුය. පාසල් ජනගහණයෙන් 63% ක් ප්‍රාථමික අංශයේ සිසුන්ය. ජාතික අවශ්‍යතාවන් සපුරාලනයේ අධ්‍යාපන පරමාර්ථ මුදුන්පත් කිරීමේ ආරම්භය ප්‍රාථමික අධ්‍යාපනයේදී සිදුවේ. ප්‍රාථමික පාසලේ අංශ ප්‍රධාන්න් හා විදුහල්පති වරුන් ලෙස කටයුතු කරන්නේද පුහුණු ගුරුවරුන්මය. පාසල් ජනගහණයෙන් 30% ක් පමණ වන 7-11 වසර සිසුන්ගේ අධ්‍යාපනික කටයුතුවලද වැඩි වගකීමක් පුහුණු ගුරුවරුන් සතුමය. මේ රටේ මුළු ගුරු සංඛ්‍යාවෙන් 55% පුහුණු ගුරුවරු වෙති. එනිසා පුහුණු ගුරුවරයා සතු කාර්යභාරය සපුරාලීමට සමත් කාර්ය බද්ධ ප්‍රවීණතාවක් ගුරුපුහුණු පාඨමාලා තුළින් ලැබේදැයි විමසා බැලීම ඉතාම කාලෝචිතය. තුන් අවුරුදු ගුරුපුහුණු පාඨමාලාවේ වෘත්තීය අධ්‍යාපන ඛණ්ඩයට අයත් අධ්‍යාපන මූලධර්ම, අධ්‍යාපන මනෝවිද්‍යාව, ප්‍රායෝගික ඉගැන්වීමේ පුහුණුව පිළිබඳ විෂය නිර්දේශයන් ආශ්‍රයෙන් වර්තමාන පයෙෂණය සැලසුම් වී. ඇත. එබැවින් මෙම පර්යේෂණයේ ප්‍රතිඵල හා ඒ ආශ්‍රිත යෝජනා ගුරු පුහුණු පාඨමාලා සංශෝධනයන් සඳහා බෙහෙවින් උපකාර වනවා පමණක් නොව ඒ පිළිබඳ පෙළඹවීමකටද හේතුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේම ගුරුවිද්‍යාල වලින් අපේක්ෂිත සේවාවේ ගුණාත්මක වර්ධනයක් කෙරෙහි අවධානයක්, ගුරුසේවාවේ ගුණාත්මක වර්ධනය සඳහා නව මං විමසීමේ අවශ්‍යතාව කරා යොමුවීමක් ඉටුවනු ඇතැයි විශ්වාස කළහැකිය.

අරමුණු:

ගුරු පුහුණුව සඳහා සිසුන් බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය විමසා බැලීම.

දැනට පවත්නා තුන් අවුරුදු ගුරුපුහුණු පාඨමාලාවේ වෘත්තීය අධ්‍යාපන ඛණ්ඩයට අයත් විෂය නිර්දේශය විමසා බැලීම.

ඉගැන්වීමේ පුහුණුව (ප්‍රායෝගික ගුරුපුහුණුව) පිළිබඳ වැඩපිළිවෙල ගුරුවරයාගේ වෘත්තීය ප්‍රවීණතාව ඉලක්ක කොට ගෙන සැළසුම් කර ඇත්දැයි විමසා බැලීම.

ගුරුපුහුණු පාඨමාලාව හැදෑරීමට පෙර හා පසුව වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ අපේක්ෂණ හා ඇගැයුම්වල වෙනස අධ්‍යයනය කිරීම.

ගුරුපුහුණුව අවසන් කළ ගුරුවරුන් එදිනෙදා මතුවන සේවා ගැටළුවලට සාර්ථකව මුහුණදීමට සමත්ව තිබේදැයි විමසා බැලීම.

ගුරුපුහුණුව ලබන්නවුන් අතර වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ සංජානනය හා ප්‍රවීණතාව ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙසෙසි වෙනයක් පවතීදැයි විමසා බැලීම.

ගුරුපුහුණු පාඨමාලාවේ වෘත්තීය අධ්‍යාපන ඛණ්ඩයේ යම් යම් අඩු පාඩු පවතීනම් ඒ සඳහා සුදුසු ප්‍රතිකර්ම විමසාබැලීම හා අවශ්‍ය ඇඟවීම් මතුකොට දැක්වීම.

නියැදිය.

ගුරුවිද්‍යාල හයකින් පාඨමාලා පහකට අයත් වනලෙස පළමුවසර, දෙවන වසර හා පුහුණුව අවසන්තර දෙවසරක සේවය ඇති ගුරු-වරුන්ගෙන් සියය බැගින් ද, ගුරුවරියන්ගෙන් සියය බැගින් ද හයසියයක පිරිසක් අහඹුලෙස තෝරා ගෙන ඇත.

## පරියේෂණ සැළැස්ම.

මෙය සමාජවිද්‍යා ක්ෂෙත්‍රයේ සිදුකෙරෙන විස්තරාත්මක පරියේෂණයකි. ගුරුපුහුණු පාඨමාලාවේ වෘත්තීය අධ්‍යාපන ඛණ්ඩය පිළිබඳව විමර්ශනය කිරීමේදී අදාල සාහිත්‍ය කෘති පරිශීලනය කරන ලදී. එසේම අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරුපුහුණු ඒකකයේ අදාල නිලධාරීන් සමගද, ලංකාවේ විවිධ ප්‍රදේශවල අධ්‍යාපන ක්ෂෙත්‍රයේ නියැලුණු ප්‍රවීණයන් 211 සමගද, සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. මෙම සම්මුඛ සාකච්ඡාද අදාල සාහිත්‍ය හා විෂය නිර්දේශ පරිශීලනය තුළින් ලැබූ අත්දැකීම්ද, පදනම් කර තැනූ පොදු ප්‍රශ්නාවලිය එහි විශ්වාස්‍යතාව හා වලංගුතාව ආරක්ෂාවන පරිදි සම්මත කරන ලදී. එය නියැදිය සඳහා යොමුකර ලැබූ ප්‍රතිචාර පරියේෂණ අවශ්‍යතා අනුව අභ්‍යුපගමනය අටක් පරීක්ෂාව සඳහා යොදාගන්නා ලදී. එහිදී ප්‍රතිශත භාවිතයද, කයිවර්ග වෙසෙසි පරීක්ෂණ හා මධ්‍යනයයන් අතර වෙසෙසි පරීක්ෂණද කර ඇත.

## නිගමන සහ යෝජනා.

දත්ත විශ්ලේෂණයට අනුව ගුරු විදුහල්වලට ඇතුළත් කර ගැනීමේදී නියැදියෙන් 75.33% ක් තරඟ විභාග ක්‍රමය සුදුසු බව අනුමත කරන නිසාද, 95.17% ක්ම ගුරුවිද්‍යාලයීය අභ්‍යන්තර පුහුණුවට කැමැත්ත දක්වා ඇති නිසාද; 81.17% ක් පූර්වසේවා පුහුණුවක් ලබාදීම වඩා ඵලදායී බව පිළිගන්නා නිසාද ගුරුසේවයට කැමැත්ත දක්වන්නවුන්ගෙන් තරඟ විභාග ක්‍රමයක ප්‍රතිඵල අනුව සුදුස්සන් තෝරා ගුරු විද්‍යාලයීය පුහුණුවක් ලබාදීමෙන් පසුව සේවයට ප්‍රවේශ කිරීමේ අවශ්‍යතාව තැපී පෙනේ. එපමණක් නොව ආයතනික පුහුණුවට පරිබාහිර වූ වෙනත් පුහුණු ක්‍රමයකට

තැමැත්ත දක්වා ඇත්තේ 4.83% කි. එයින්ද ස්ථානීය පුහුණුවකට තැමැත්ත දක්වා ඇත්තේ 2.83% කි. මේ තත්ත්වය පවතිද්දී දැනට පවත්වාගෙන යන දුරස්ථ ගුරුපුහුණු ක්‍රමය තුළින් ගුරුපුහුණුවේ ගුණාත්මක සංවර්ධනය කෙතරම් ආරක්ෂා වන්නේදැයි වහා විමසා බැලීමේ අවශ්‍යතාවද මතුවී පෙනේ.

තවද දෙවන වසර ගුරු විද්‍යාලයීය පුහුණුව අවසානයේ තමා ලැබූ ප්‍රවීණතාව පිළිබඳව සෑහීමට පත්ව ඇත්තේ 34.26% කි. එහෙත් පළමු වසර ගුරු පුහුණුව ආරම්භයේ තම ප්‍රවීණතාව පිළිබඳව සෑහීමට පත් සංඛ්‍යාව 52.07% කි. එයින් හෙළිවන්නේ තම ප්‍රවීණතාවෙන් ආරම්භයේ සෑහීමට පත්වුවත් ගුරුපුහුණුව තුළින් ලැබූ දැනුම, කුශලතා හා ආකල්ප පදනම්කරගත් සංජානනය හේතුවෙන් බලනවිට එම ප්‍රවීණත්වයේ සීමිත බව ඔවුන් ප්‍රත්‍යක්ෂකොටගත් බවකි. මේ නිසාද ගුරුපුහුණුවේ අවශ්‍යතාව වඩාත් පැහැදිලි වේ.

තවද පළමුවසර ආරම්භයේ, දෙවන වසර අවසානයේ හා පුහුණුව අවසන් කර දෙවසරක සේවයට පසුව ඔවුන්ගේ වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ සංජානනය හා ප්‍රවීණතාව වෙසෙයි ලෙස වෙනස්වන බව ඔප්පුවීමෙන්ද ගුරුපුහුණුවේ අවශ්‍යතාව මැනවින් පෙනේ.

පුහුණුව ලබා දෙවසරකට පසුව ප්‍රවීණතා මට්ටම 58.62% දක්වා වැඩිවීමෙන් 24.36% ක ප්‍රගතියක් පෙන්වා ඇත. ඒ අනුව ගුරු පුහුණුවෙන් පසුව අඛණ්ඩ ඇගැයීමක අවශ්‍යතාව මෙන්ම සේවාස්ථ පුහුණුවේ වැදගත්කමද, වෘත්තීය සූදානම ඇගැයීමේ ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යාමේ වැදගත්කමද පිළිබිඹුවේ. මින් මතුවන තවත් වැදගත් කරුණක් නම් ගුරුපුහුණුවේ කාලය තව වසරකින් හෝ දීර්ඝ කළයුතු බවය. දෙවන වසර අවසානයේ

ගුරු සිසුන් 49.79% ක්ම තම ප්‍රවීණතාව තව දියුණු කර ගතයුතු බව ප්‍රකාශ කිරීමෙන්ද එය තහවුරු කර ඇත. ඒ අනුව තුන් අවුරුදු ගුරුපුහුණුව සිව් - අවුරුදු ගුරුපුහුණුවක් බවට පත්කර ගැනීම සුදුසුවේ. සේවාස්ථ පුහුණුවීමේ සැසි ප්‍රාදේශීය මෙන්ම ස්ථානීය වශයෙන් පවත්වා උපරිම ඵල ලබාගැනීමට දිරිගැන්විය යුතුව ඇත.

ගුරුවරයාගේ අධ්‍යාපන මට්ටම උසස් කර ගැනීමටත්, නවීකරණයන්ට අනුව හැඩගැසීමටත් අවශ්‍ය පශ්චාත් අධ්‍යාපනික පහසුකම් වැඩිකිරීම වැනි කාර්ය මගින් ගුරුවරුන් ඒ සඳහා පෙළඹවීමේ අවශ්‍යතාවද පෙන්නුම් කර ඇත. එසේම පශ්චාත් අධ්‍යාපනික සුදුසුකම් ලැබූවන් සුදුසු උපස්ථම්භක නොලබන්නේ නම් එය අනාගතයේ දී ජාතික අවාසියක් වේ.

ගුරු පුහුණුව ලබන කාලය තුළ (න්‍යායාත්මක අවස්ථාවේ දී ) වෘත්තීය අධ්‍යාපනික අවශ්‍යතා සංජානනය හා ප්‍රවීණතාව පිළිබඳ ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙසෙසි වෙනසක් පිළිඹිබු වෙතත් පුහුණුව ලබා දෙවසරක් පාසැල් ක්ෂේත්‍රය තුළ ප්‍රායෝගික කටයුතුවල යෙදීමෙන් පසුව එබඳු වෙසෙසි වෙනසක් නැතිබව හෙළිව් ඇත.

පොදු ප්‍රශ්නාවලිය අනුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික තොරතුරු ඇතුළත් විෂය ක්ෂේත්‍රය පිළිබඳ අවශ්‍යතාව නියැදියෙන් 58.4% සංජානනය කර ඇතත් ඒ පිළිබඳව ප්‍රවීණතාව ප්‍රකාශ කර ඇත්තේ 18% කි. දියුණුවෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රගතියක් සඳහා අධ්‍යාපනික කටයුතු මෙහෙයවන ගුරුභවතුන් තුළ ඒ පිළිබඳ මනා අවබෝධයක් හා ප්‍රවීණතාවක් තිබිය යුතුය.

තවද, අධ්‍යාපන මනෝවිද්‍යාව ක්ෂෙත්‍රයට අයත් මිනුම් හා ඇගැයුම් පිළිබඳව මනා සංඥානනයක් දෙවන වසර අවසානයේ තියැදියෙන් 79.19% කට ඇතත් ඒ පිළිබඳ ප්‍රවීණතාවක් ඇත්තේ 25.33% කටය. මේ තත්ත්වයද ඉතා කනගාටුදායකය. අධ්‍යාපන ක්‍රියාවලියේ විවිධ අවස්ථාවල අනිවාර්යයෙන්ම සිදුවියයුතු ඇගැයීම් කටයුතු පිළිබඳ ප්‍රවීණතා පුහුණු ගුරුවරුන්ටත් නොමැතිනම් එය ජාතික අපේක්ෂාවන් කඩකරන්නකි. එබැවින් ගුරු අධ්‍යාපන ආයතන හා බලධාරීන්ගේ දැඩි අවධානය ඊට යොමුවිය යුතුය.

මනා සංඥානනයක් හා ප්‍රවීණතාවක් ඇති ගුරුභවතුන් සේවයට ප්‍රවේශ කළයුතු මෙන්ම ඔවුන් ආරක්ෂා කරගැනීමද කළයුතුය. විශේෂයෙන් විනය පිළිබඳ ගැටළුවලදී සාධාරණ ක්‍රියාමාර්ග ගතයුතු අතර එබඳු ගුරුවරුන් පුනරුත්ථාපන කාර්යයක යෙදීමෙන් පසු ස්ථාන මාරුවීම් දියයුතුය. නොඑසේනම් අකාර්යක්ෂම සේවාවක් සමගම නව විදුහලේ විශාල ශිෂ්‍ය පිරිසකට හානිද සිදුවේ. වෘත්තීය වශයෙන්ද අගෞරවයක් සිදුවීමට බොහෝ ඉඩ ඇත.

ගුරුපුහුණු පාඨමාලාවේ වෘත්තීය අධ්‍යාපන ඛණ්ඩය තුළින් සංඥානනමය වශයෙන් හා ප්‍රවීණතා වශයෙන් ප්‍රගතියක් ඇති කරනවා මෙන්ම ආකල්පමය වශයෙන්ද ප්‍රගතියක් සිදු නොකළහොත් ගුරු ක්ෂෙත්‍රයේ අනාගතය අඳුරුවිය හැකිය. පාසල දෙස විවිධ දෘෂ්ටිකෝණවලින් බලන මෙවන් යුගයක ගුරු සත්චාරිත්‍ර මාලාවක් සම්මත කර ක්‍රියාත්මක කිරීම රජයේ හා වෘත්තීය සමිතිවල වැදගත් කාර්ය භාරයකි.

------